


# වතුරට බය
# තාරා පැටියා

යුවිනි සෙනීෂා විජේවර්ධන

# පිදුම

පාට හීන අකුරු කරන්න

දිරිය දූන්

දයාබර ගුරු මව්වරුන්ටත්, පියවරුන්ටත්

ආදරණීය

අම්මටත්, අප්පච්චිටත්

සෙනෙහසින් .....

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මහපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් සැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.


එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන  අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍යය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් අදවි උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

ලොකු කැලෑවක් ඇතුලේ තිබුණ ලස්සන විලක තාරා පවුලක් සිටියා.




පුංචි තාරා පැටව් හය දෙනයි, තාරා අම්මයි ,තාරා තාත්තයි හරිම සතුටින් හිටියේ.




හැමදාම උදේට තාරා අම්මා පැටවුන්ට පීනන්න කියලා දෙනවා. තාරා පැටවු පස් දෙනෙක්ට හොඳට පීනන්න පුලුවන් උනත් එක් තාරා පැටියෙක් හරිම බයෙන් තමා විල ළඟට ආවේ.



තාරා අම්මා කොයි තරම් උත්සහ කළත් එයාට බැරිවුණා මේ තාරා පැටියව වතුරට ගන්න. පුංචි තාරා පැටියා කළේ තනියම විලේ ඉවුරට වෙලා සෙල්ලම් කරන අනෙක් පැටවු දිහා බලන් ඉන්න එක.




එක දවසක් තාරා අම්මා උදේම නැඟිටලා චූටි තාරා පැටියා එක්ක විල ළඟට ආවා. එයා හොඳටම බය වෙලා පඳුර අස්සේ හැංගුණා. ඒත් අම්මා එයාව එක්ක ඇවිත් තුරුලු කරගෙන මෙහෙම කිව්වා.



“ මගේ චූටි පැටියෝ, ඔයා චුට්ටක්වත් බය වෙන්න එපා. අම්මා ඔයා ළඟම ඉන්නවා. ඔයා කොහොම මරි පීනන්න ඉගෙන ගන්න ඕනේ...”

“ඒත් අම්මමේ වතුර දැක්කම මට හරි බයක් දැනෙනවා. ” චූටි තාරා පැටියා කිව්වා.




“හොඳයි ,එන්නකෝ, ඔයාගේ චූටි කකුල් ඉස්සෙල්ලාම වතුරට දාන්නකෝ ” අම්මා කිව්වා.


තාරා පැටියා හිමින් හිමින් සීතල වතුරට කකුල් දැම්මා.

“අනේ අම්මේ මගේ ළඟින්ම ඉන්නකෝ. ”තාරා පැටියා බයෙන් කිව්වා.

“ අම්මා ඔයාට කවදාවත් කරදරයක් වෙන්න දෙන්නේ නැනේ. අම්මාව විශ්වාස කරන්නකෝ. ” තාරා අම්මා කිව්වා.




බොහොම හෙමින් හරිම බයෙන් තාරා පැටියා වතුරට බැස්සා .එයා හිතුවේ එයාව ගහගෙන යයි කියලා.ඒත් හිතපු තරම් බයක් දැනුණේ නැහැ එයාට.




අම්මා එයාගේ තටු පෙන්නලා පීනන විදිය ටික ටික කියලා දුන්නා. තාරා පැටියත් ආසාවෙන් ඒවා ඉගෙන ගත්තා. අනිත් තාරා පැටවු අම්මව හොයාගෙන විල ළඟට එද්දී එයාලා දැක්කා චූටි තාරා පැටියා විලට බැහැලා ඉන්නවා. හැමෝම සතුටින් කෑ ගැහුවා.




“මේ බලන්න මම පීනනවා. ”තාරා පැටියා කෑ ගහලා කිව්වා.



තාරා අම්මාත් ,තාරා තාත්තාත් චූටි පැටවු එක්ක වතුරට බැහැලා පීනන්න පටන් ගත්තා.



“ස්තූතියි අම්මේ, ඔයා මගේ බය නැති කළා. මට දැන් හැමෝම එක්ක පීනන්න, සෙල්ලම් කරන්න පුලුවන්. ” චූටි තාරා පැටියා කිව්වා. හැමෝටම එදා හරිම සතුටු දවසක්.



# ස්තූතිය

සිප් කිරි පොවා

දිවි මඟ දෙනෙත් පෑදූ

ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ටත් .....

පුංචි අපේ සිතුවිලි

ග්‍රන්ථයක් සේ එළි දැක්වීමට දිරිය දුන්

දයාබර ඔබ සැමටත්....

වසර අටක් මා

ගුණ නුවණින්, දිරියෙන්

පෝෂණය කළ

මාගේ ආදරණීය අම්මාටත්, අප්පච්චිටත්

සුරතල් සිනාපාමින් මා අසලම දැවටෙන

මගේ මල්ලියාටත්

මාගේ හදපිරි ස්තූතිය පුද කරමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍යය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩ නැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයන් හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යෘපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කරුවෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනවිරත්න මහ ලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යෘපෘතියේ නිර්මාතෘ
2023-10-20

ISBN NO – 978-624-206-998-2
9 786242 069982